# ජාතික ගමනාගමන කොමිෂන් සභාව

# අන්තර් පළාත් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා අයදුම්පත්‍ර කැඳවීම

පහත සඳහන් අන්තර් පළාත් (අධිවේගී මාර්ගය හරහා) මාර්ග වල මගී ප්‍රවාහන සේවාවන් සඳහා නව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. ධාවකයින් තෝරා ගැනීමේදී සමගාමී මාර්ගයේ සුඛෝපභෝගී අවසරපත්‍ර හිමි ධාවකයන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

| අනු අංකය | මාර්ගය | මාර්ග අංකය | සේවාව | පවතින පුරප්පාඩු සංඛ්‍යාව | අවම ලංසු මුදල | සමගාමී මාර්ගයේ මාර්ග අංකය |
|---|---|---|---|---|---|---|
| 01. | ගාල්ල - කොළඹ (පින්නදූව, කෙරවලපිටිය, , පෑලියගොඩ හරහා) | EX 01-89 | අධි සුඛෝපභෝගී | 03 | 1,782,000.00 | 2-1 |
| 02. | කොළඹ - ගාල්ල (පෑලියගොඩ, කෙරවලපිටිය, පින්නදූව හරහා)) | EX 01-89 | අධි සුඛෝපභෝගී | 02 | 1,782,000.00 | 2-1 |
| 03 | මාතර - කොළඹ (ගොඩගම, කෙරවලපිටිය, පෑලියගොඩ හරහා) | EX 01-109 | අධි සුඛෝපභෝගී | 02 | 2,106,000.00 | 2 |
| 04 | කොළඹ - මාතර (පෑලියගොඩ, කෙරවලපිටිය ගොඩගම හරහා) | EX 01-109 | අධි සුඛෝපභෝගී | 01 | 2,106,000.00 | 2 |

සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සියළුම කොන්දේසි වලට යටත්ව අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු වේ.

- දැනට හිමි වලංගු මගී සේවා අවසර පත්‍රයක් වෙනුවෙන් ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම් පත්‍රයක් පමණි.
- බලපත්‍රලාභියෙකුට සමගාමී ධාවන මාර්ගයේ මගී සේවා අවසර පත්‍ර දෙකකට වඩා තිබෙන අවස්ථාවකදී ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ හැකි උපරිම ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව දෙකක් පමණි. එසේ නොකරන අවස්ථාවන්හිදී ඉදිරිපත් කරන ලද සියලුම ඉල්ලුම්පත්‍ර අවලංගු කරනු ලැබේ.
- සමාගමක් හෝ ව්‍යාපාරයක් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී , එහි අධ්‍යක්ෂකවරුන් හෝ හවුල් කරුවන්ට හා එකම අධ්‍යක්ෂවරුන් හෝ හවුල්කරුවන් ඇති විවිධ සමාගම් හෝ ව්‍යාපාර වලටද වෙනම අයදුම් පත්‍ර එම මාර්ග සඳහා ඉදිරිපත් කළ නොහැකිය.
- නව මගීසේවා අවසරපත්‍රය නිකුත් කිරීමත් සමඟ එම අවසර පත්‍රය නිකුත් කිරීමට පාදක කර ගනු ලබන සමගාමී මාර්ගයේ අවසර පත්‍රය අවලංගු කරනු ලැබේ.

- ❖ මගී සේවා අවසරපත්‍රයේ වලංගු කාලය අවසානයේදී පනතේ වගන්ති අනුව වසරකට නොඅඩු හා වසර තුනකට නොවැඩි කාලයක් සඳහා අවසර පත්‍රය වලංගු කරනු ලැබේ. මෙම අවසර පත්‍රය අලුත් කිරීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතු වේ.

- ❖ පළමු වර්ෂය සඳහා ඉල්ලුම් කරනු ලබන ලංසු මුදල ගෙවිය යුතු අතර, දෙවන වර්ෂයේ සිට මගීසේවා අවසරපත්‍රය අලුත් කිරීමේ දී ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන තාක්ෂණික අගය ගෙවිය යුතුවේ.

- ❖ ධාවකයින් තෝරා ගැනීමේදී තාක්ෂණික නිර්ණායක මත 90%ක් හා පිරිවැය නිර්ණායක මත 10%ක්ද ලෙස ලකුණු ලබා දෙනු ලැබේ.

- ❖ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.

මේ සඳහා වන ඉල්ලුම් පත්‍ර කොළඹ 05, උද්‍යාන පාරේ, අංක 241 හි පිහිටි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ධාවන දෙපාර්තමේන්තුවට පැමිණ ලබා ගත හැකි අතර, එක් ඉල්ලුම් පත්‍රයක් සඳහා රු.4000/= ක මුදලක් ගෙවිය යුතුය.

2024.07.12 වන දින සිට 2024.08.01 දින දක්වා (දෙදිනම ඇතුළුව) සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප.ව.03.00 දක්වා ධාවන දේපාර්තමේන්තුවේදී ඉල්ලුම්පත්‍ර නිකුත් කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් නිකුත් කරන ඉල්ලුම් පත්‍ර පමණක් මේ සඳහා වලංගු වේ.

ඉල්ලුම්කරු ඇප මුදල් වශයෙන් රුපියල් ලක්ෂ දෙකක (රු. 200,000.00 ක) මුදලක් තැන්පත් කළ යුතු අතර, ඉල්ලුම් ඇප මුදල් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 119100223693155 ගිණුමට බැර කර ලබාගත් කුවිතාන්සිය 2024.08.01 දින ප.ව. 3.00 ට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මුදල් අයකැමි වෙත ඉදිරිපත් කර ලදුපතක් ලබා ගත යුතු වේ. එම ලදුපත ඉල්ලුම්පත්‍රය සමඟ ලියුම් කවරයට අමුණා තිබිය යුතු අතර, ලියුම් කවරය ධාවන දෙපාර්තමේන්තුවේ තබා ඇති පෙට්ටියට බහාලිය යුතුවේ.

අදාල අයදුම් පත්‍ර භාර ගැනීම 2024.08.02 වැනි දින පෙ.ව.10.00 ට අවසන් කරනු ලබන අතර, නියමිත කාලය ඉකුත් වූ වහාම ඉල්ලුම්පත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ශ්‍රවණාගාරයේදී විවෘත කරනු ලැබේ. ඉල්ලුම් පත්‍ර ඇගයීම කමිටුවක් මගින් සිදු කරන අතර, එම කමිටුව කැඳවන දිනය එහිදී ඔබ වෙත ලබා දෙනු ලැබේ.

අවශ්‍ය සියලු විස්තර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ධාවන දෙපාර්තමේන්තුවට පැමිණ හෝ දුරකථන අංක 011-2587372 ඇමතීමෙන් ලබා ගත හැක.

මගී සේවා අවසර පත්‍ර පිරිනැමීමේ හෝ අවලංගු කිරීමේ සම්පූර්ණ අයිතිය ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතුවන අතර, ඉල්ලුම්කරුවන්ට දැරීමට සිදුවන වියදම් පිළිබඳව කොමිෂන් සභාව වගකීම භාරගනු නොලැබේ.

සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන්
සභාව,
උද්‍යාන පාර,
කොළඹ 05.